# පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් 25 ක් මාර්තු 12 ව්‍යාපාරයට

■ අමිත් මධුරංග

පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් 25 දෙනෙකු පමණ මාර්තු 12 ව්‍යාපාරයට සහාය පළ කිරීමට එකඟතාව පළකර ඇතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවසීය.

මෙම මන්ත්‍රී පිරිස එක්සත් ජාතික පක්ෂය, එක්සත් ජනතා නිදහස් සන්ධානය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු පාර්ලිමේන්තුව නියෝජනය කරන බොහෝ පක්ෂවලට අයත් බවත්, ඔවුන් සමග මේ දක්වා සාකච්ඡා වට තුනක් පවත්වා තිබෙන බවත් තෙන්නකෝන් මහතා ප්‍රකාශ කළේය.

පාර්ලිමේන්තු සංකීර්ණයේ පැවැති මාධ්‍ය හමුවකදී ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේ නිර්ණායක 08 ක් මත කටයුතු කිරීමට එම මන්ත්‍රීවරුන් එකඟතාව පළ කර ඇති බවයි. ප්‍රාදේශීය සභා, පළාත් සභා, පාර්ලිමේන්තුව සඳහා අපේක්ෂකයන්ට නාමයෝජනා ලබාදීමේදී සලකා බැලිය යුතු නිර්ණායක මාලාවකට පක්ෂ නායකයන් මීට පෙර අත්සන් කළ බවද ඔහු කීය. ඊයේ පැවති මාධ්‍ය හමුව සඳහා බුද්ධික පතිරණ, ආශු මාරසිංහ, මයන්ත දිසානායක, තාරක බාලසූරිය, ශ්‍රියානි විජේවික්‍රම, රෝහිණී කුමාරි විජේරත්න, හේෂාන් විතානගේ, තුෂාර ඉඳුනිල් යන මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියෝ එක්ව සිටියහ.